## WEATHER FORECAST FOR 20th JULY 2019
**(Issued at 05.30 a.m. on 20th July 2019)**

**Prevailing windy condition over the country (particularly over southern half of the island) and North-western, Western, South-western and Southern sea areas are likely to continue today.**

Very strong gusty winds up to (60-70) kmph are likely over the island, particularly in Western, Southern, Central, Sabaragamuwa, North-western and North-central provinces and in Trincomalee district, strong gusty winds up to (40-50) kmph can be expected elsewhere.

Showers or thundershowers will occur at times in Sabaragamuwa and Central provinces and in Galle, Matara and Kaluthara districts. Several spells of showers will occur in North-western province and in Gampaha, Colombo and Hambanthota districts.

Fairly heavy falls about 75 mm are likely at some places in Central and Sabaragamuwa provinces.

**There may be temporary localized strong winds during thundershowers. General public is kindly requested to take adequate precautions to minimize damages caused by lightning activity.**

දිවයින හරහා( විශේෂයෙන් දකුණු අර්ධයේ) සහ දිවයිනට වයඹ, බස්නාහිර, නිරිත සහ දකුණු දෙසින් වන මුහුදු ප්‍රදේශවල දැනට පවතින තද සුළං තත්ත්වය අද දිනයේදීත් තවදුරටත් බලාපොරොත්තුවේ.

බස්නාහිර, දකුණු, මධ්‍යම, සබරගමුව, වයඹ සහ උතුරු-මැද පළාත්වලත් ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේත් විටින් විට හමන පැ.කි.මී. (60-70) පමණ දක්වා වන ඉතා තද සුළං ද, සෙසු ප්‍රදේශවල විටින් විට හමන පැ.කි.මී. (40-50) පමණ දක්වා තද සුළං ද ඇති විය හැක.

සබරගමුව සහ මධ්‍යම පළාත්වලත් ගාල්ල, මාතර සහ කලුතර දිස්ත්‍රික්කවලත් විටින් විට වැසි හෝ ගිගුරුම් සහිත වැසි ඇතිවේ. වයඹ පළාතේ සහ කොළඹ, ගම්පහ සහ හම්බන්තොට දිස්ත්‍රික්කවල වැසි වාර කිහිපයක් ඇති වේ.

මධ්‍යම සහ සබරගමුව පළාත්වල ඇතැම් ස්ථාන වලට මි.මී. 75 ක පමණ තරමක් තද වර්ෂාපතනයන් ඇති විය හැක.

ගිගුරුම් සහිත වැසි ඇති වන විට එම ප්‍රදේශවල තාවකාලිකව තද සුළං ඇති විය හැක. අකුණු මගින් සිදුවන අනතුරු අවම කර ගැනීමට අවශ්‍ය පියවර ගන්නා ලෙස ජනතාවගෙන් කාරුණිකව ඉල්ලා සිටිනු ලැබේ.

## WEATHER FORECAST FOR SEA AREAS AROUND THE ISLAND DURING NEXT 24 HOURS (Issued at 05.30 a.m. on 20th July 2019)

**Windy conditions is likely to continue in the North-western, Western, South-western and Southern sea areas of the island until the 21st July morning.**

Showers or thundershowers will occur at several places in the sea area off the coast extending from Puttalam to Hambanthota via Colombo and Galle. Showers or thundershowers may occur at a several places in the other sea areas around the island in the evening or night.

Winds will be North-westerly to Westerly and speed will be (40-50) kmph in the sea areas around the island.

**The sea area extending from Mannar to Pottuvil via Puttalam, Colombo, Galle and Hambantota will be very rough at times as the wind speed can increase up to (70-80) kmph at times.**

**Fishermen are advised not to venture into the above sea areas and naval communities are also requested to be vigilant until the 21st July morning.**

## ඉදිරි පැය 24 සඳහා දිවයින වටා ඇති මුහුදේ කාලගුණ තත්ත්වය
**2019 ජුලි මස 20 දින උදෑසන 05.30 ට නිකුත් කරන ලදි.**

දිවයිනට වයඹ, බස්නාහිර, නිරිත සහ දකුණු දෙසින් වන මුහුදු ප්‍රදේශවල සුළං තත්ත්වය ජූලි මස 21 වන දින උදෑසන දක්වා තවදුරටත් බලාපොරොත්තුවේ.

පුත්තලම සිට කොළඹ සහ ගාල්ල හරහා හම්බන්තොට දක්වා වෙරළට ඔබ්බෙන් වන මුහුදු ප්‍රදේශවල තැනින් තැන වැසි හෝ ගිගුරුම් සහිත වැසි ඇතිවේ. දිවයින වටා සෙසු මුහුදු ප්‍රදේශවල සවස් කාලයේ හෝ රාත්‍රී කාලයේදී තැනින් තැන වැසි හෝ ගිගුරුම් සහිත වැසි ඇති විය හැක.

දිවයින වටා මුහුදු ප්‍රදේශවල සුළං වයඹ සිට බස්නාහිර දක්වා වන දිශා වලින් හමන අතර සුළගේ වේගය පැ.කි.මී. (40-50) පමණ වේ.

මන්නාරම සිට පුත්තලම, කොළඹ, ගාල්ල සහ හම්බන්තොට හරහා පොතුවිල් දක්වා වන මුහුදු ප්‍රදේශවල සුළගේ වේගය විටින් විට පැ.කි.මී. (70-80) දක්වා වැඩි විය හැකි අතර මෙම මුහුදු ප්‍රදේශ විටින් විට ඉතා රළු වේ.

මෙම මුහුදු ප්‍රදේශය තුල 2019 ජුලි 21 වන දින උදෑසන කාලය දක්වා ධීවර කටයුතු වල නොයෙදෙන ලෙස ධීවර ප්‍රජාවට අවවාද කරන අතර නාවුක ප්‍රජාව මේ පිලිබදව ඉතා අවධානයෙන් කටයුතු කරන ලෙස ඉල්ලා සිටිනු ලැබේ.

EMERGENCY OPERATIONS DIVISION
RECEIVED
Date : 2019/07/20
Time : 05:55 hrs
D (Ops)/DO/ADO

S. ...

කාලගුණ විද්‍යාඥ (Duty Meteorologist),
කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව (Department of Meteorology)